
# මාසික වෙළඳ විවරණිකාව

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව


2023 පෙබරවාරි
05 වෙළුම 02 නිකුතුව

## විශේෂ සිදුවීම්

### මාසික අපනයන ක්‍රියාකාරිත්වය





### මාසික ආනයන ක්‍රියාකාරිත්වය





2023 වසරේ පෙබරවාරි මාසය තුළ දී වෙළඳ භාණ්ඩ අපනයන ආදායම එ.ජ. ඩොලර් මිලියන 982ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 10.2කින් පහළ ගියේය.

2023 වසරේ පෙබරවාරි මාසය තුළ දී වෙළඳ භාණ්ඩ ආනයන වියදම එ.ජ. ඩොලර් මිලියන 1,021ක් දක්වා පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සියයට 45.5කින් පහළ ගියේය.

### අපනයන හා ආනයන වර්ධන අනුපාත (%)





### වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)




2023 වසරේ පෙබරවාරි මාසයෙන් අවසාන වන මාස දෙක තුළ දී පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව අපනයන ආදායම සහ ආනයන වියදම, පිළිවෙළින්, සියයට 10.7කින් සහ සියයට 37.1කින් පහළ ගියේය.


වෙළඳ ගිණුමේ හිඟය, 2022 වසරේ පෙබරවාරි මාසයේ දී පැවති එ.ජ. ඩොලර් මිලියන 780ට සාපේක්ෂව 2023 පෙබරවාරි මාසයේ දී එ.ජ. ඩොලර් මිලියන 39ක් දක්වා පහළ ගියේය.

## ප්‍රධාන අපනයන හා ආනයන කාණ්ඩ - (2023 ජන. - පෙබ.)




# අපනයන ක්‍රියාකාරිත්වය

### අපනයන ක්‍රියාකාරිත්වය - (ජන. - පෙබ.)




### අපනයන පරිමා හා මිල දර්ශක - (ජන. - පෙබ.)





2023 වසරේ පෙබරවාරි මාසයෙන් අවසාන වන මාස දෙක තුළ දී, කාර්මික, කෘෂිකාර්මික සහ ඛනිජමය නිෂ්පාදිත අපනයන ඇතුළු සියලුම ප්‍රධාන කාණ්ඩවල ඉපැයීම් අඩුවීම හේතුවෙන් අපනයන ආදායම පහළ ගියේය.


2023 වසරේ පෙබරවාරි මාසයෙන් අවසාන වන මාස දෙක තුළ දී, අපනයන පරිමා දර්ශකය සියයට 6.5කින් ඉහළ ගිය අතර, අපනයන මිල දර්ශකය සියයට 16.2කින් පහළ ගියේය.

## කෘෂිකාර්මික අපනයන


### කෘෂිකාර්මික අපනයන ආදායම





### කෘෂිකාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




### කෘෂිකාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන. - පෙබ.)




### තේ සහ රබර් මිල ගණන් *





*2022 වසරේ ජූලි මාසයේ දී රබර් (දුම් ගැසූ දාර රබර්) සඳහා වෙන්දේසියේ දී මිල ගණන් නියම වී නොමැත


2023 වසරේ පෙබරවාරි මාසයෙන් අවසාන වන මාස දෙක තුළ දී ප්‍රධාන වශයෙන් පොල්, මුහුදු ආහාර, සුළු කෘෂිකාර්මික නිෂ්පාදිත සහ ස්වභාවික රබර් ඇතුළු බොහෝ කෘෂිකාර්මික භාණ්ඩ අපනයන ආදායම සමස්තයක් ලෙස පහළ යෑම හේතුවෙන් කෘෂිකාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව පහළ ගියේය. කෙසේ වුවත්, තේ, කුළුබඩු සහ එළවළු ඉහළ අපනයන ආදායම් වාර්තා කළේය.

# කාර්මික අපනයන


## කාර්මික අපනයන ආදායම





## කාර්මික අපනයන පරිමා හා මිල දර්ශක




## කාර්මික අපනයනවල ක්‍රියාකාරිත්වය (ජන. - පෙබ.)





## නැව් හා ගුවන් යානා ඉන්ධනවල අපනයන මිල ගණන්





2023 වසරේ පෙබරවාරි මාසයෙන් අවසාන වන මාස දෙක තුළ දී කාර්මික අපනයන ආදායම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව පහළ ගිය අතර, මේ සඳහා ප්‍රධාන වශයෙන්, රෙදිපිළි හා ඇඟලුම්, ඛනිජ තෙල් නිෂ්පාදිත සහ රබර් නිෂ්පාදිත ඇතුළු බොහෝ කාර්මික අපනයන ආදායම්හි සමස්තයක් ලෙස පහළ යෑම හේතු විය. කෙසේ වුවත්, මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ, යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ, සත්ත්ව ආහාර සහ සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් අපනයන ආදායම ඉහළ ගියේය.

# ආනයන ක්‍රියාකාරිත්වය

## ආනයන ක්‍රියාකාරිත්වය - (ජන. -පෙබ.)





## ආනයන පරිමා හා මිල දර්ශකය - (ජන. -පෙබ.)





අන්තර්, ආයෝජන සහ පාරිභෝගික භාණ්ඩ ඇතුළු සියලුම ප්‍රධාන කාණ්ඩවල ආනයන වියදම පහළ යෑම හේතුවෙන් 2023 වසරේ පෙබරවාරි මාසයෙන් අවසාන වන මාස දෙක තුළ දී, වෙළඳ භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව පහළ ගියේය. මේ අතර, ආනයන පරිමා දර්ශකය සහ ආනයන මිල දර්ශකය ද, පිළිවෙළින්, සියයට 21.7කින් සහ සියයට 19.8කින් පහළ ගියේය.

# පාරිභෝගික භාණ්ඩ ආනයන


### පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම





### පාරිභෝගික භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




### පාරිභෝගික භාණ්ඩ ආනයනවල ක්‍රියාකාරිත්වය (ජන. - පෙබ.)





### සීනි, පරිප්පු සහ කිරිපිටි සඳහා වූ ආනයන මිල ගණන් වල සාමාන්‍ය





ධාන්‍ය හා ඇඹරුම් කර්මාන්තය ආශ්‍රිත නිෂ්පාදිත (ප්‍රධාන වශයෙන්, සහල්), බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත, ගෘහ උපකරණ, කිරි නිෂ්පාදිත සහ ගෘහ හා දැව භාණ්ඩ ඇතුළු ආහාර සහ ආහාර නොවන පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පහළ යෑම හේතුවෙන්, 2023 වසරේ පෙබරවාරි මාසයෙන් අවසාන වන මාස දෙක තුළ දී, පාරිභෝගික භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව පහළ ගියේය. කෙසේ වුවත්, සීනි සහ රසකැවිලි, රථ වාහන, පාන වර්ග සහ මුද්‍රිත ද්‍රව්‍ය හා ලිපි ද්‍රව්‍ය සඳහා වන ආනයන වියදම ඉහළ ගියේය.

# අන්තර් භාණ්ඩ ආනයන


### අන්තර් භාණ්ඩ ආනයන වියදම





### අන්තර් භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක



අන්තර් භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන. - පෙබ.)




බොර තෙල් හා පොහොර ආනයන මිල ගණන් (මාසික සාමාන්‍ය අගයන්)





* 2022 වසරේ මාර්තු, අප්‍රේල්, ජූනි, ජූලි සහ ඔක්තෝබර් මාසවල සහ 2023 වසරේ පෙබරවාරි මාසයේ දී බොරතෙල් ආනයනය කර නැත.
** 2023 වසරේ ජනවාරි මාසයේ බොරතෙල් ආනයන දත්ත ඛනිජ තෙල් නීතිගත සංස්ථාවෙන් ලැබී නොමැත.


මූලික වශයෙන්, රෙදිපිළි හා රෙදිපිළි උපාංග, ඉන්ධන, මූල ලෝහ සහ ප්ලාස්ටික් හා ඒ ආශ්‍රිත නිෂ්පාදිත ආනයන වියදම පහළ යෑම හේතුවෙන්, 2023 වසරේ පෙබරවාරි මාසයෙන් අවසාන වන මාස දෙක තුළ දී අන්තර් භාණ්ඩ ආනයන වියදම පෙර වසරේ අනුරූප මාසයට සාපේක්ෂව සැලකිය යුතු ලෙස පහළ ගියේය. ඊට ප්‍රතිවිරුද්ධව, දියමන්ති, අගනා ගල් හා ලෝහ වර්ග, පොහොර සහ කෘෂිකාර්මික යෙදවුම් ආනයන වියදම ඉහළ ගියේය.

## ආයෝජන භාණ්ඩ ආනයන


ආයෝජන භාණ්ඩ ආනයන වියදම




ආයෝජන භාණ්ඩ ආනයන පරිමා හා මිල දර්ශක




ආයෝජන භාණ්ඩ ආනයන ක්‍රියාකාරිත්වය (ජන.- පෙබ.)




යන්ත්‍රසූත්‍ර හා උපකරණ, ගොඩනැගිලි ද්‍රව්‍ය සහ ප්‍රවාහන උපකරණ යන සියලු ප්‍රධාන ආයෝජන භාණ්ඩ කාණ්ඩවල ආනයන වියදම පහළ යෑම හේතුවෙන්, 2023 වසරේ පෙබරවාරි මාසයෙන් අවසාන වන මාස දෙක තුළ දී ආයෝජන භාණ්ඩ ආනයන වියදම සැලකිය යුතු ලෙස පහළ ගියේය.

# විදේශීය වෙළඳාම - සාරාංශය (අ)

## අපනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| | | පෙබ. 2022 | පෙබ. 2023 | වෙනස (%) | ජන. - පෙබ. 2022 | ජන. - පෙබ. 2023 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **කෘෂිකාර්මික අපනයන** | | **202.1** | **201.2** | **-0.4** | **406.6** | **392.2** | **-3.5** |
| එයින් | තේ | 100.9 | 104.6 | 3.7 | 192.1 | 204.1 | 6.3 |
| | පොල් | 34.7 | 25.0 | -27.9 | 68.0 | 47.0 | -30.9 |
| | කුළුබඩු | 27.1 | 34.2 | 26.4 | 62.1 | 68.3 | 10.0 |
| | මුහුදු ආහාර | 21.2 | 20.0 | -5.6 | 45.3 | 40.9 | -9.6 |
| **කාර්මික අපනයන** | | **885.5** | **777.1** | **-12.2** | **1,777.4** | **1,558.3** | **-12.3** |
| එයින් | රෙදිපිළි හා ඇඟලුම් | 496.4 | 431.3 | -13.1 | 1,012.5 | 855.7 | -15.5 |
| | රබර් නිෂ්පාදිත | 88.3 | 72.7 | -17.7 | 170.3 | 145.4 | -14.7 |
| | ඛනිජ තෙල් නිෂ්පාදිත | 56.8 | 44.4 | -21.8 | 124.0 | 90.8 | -26.7 |
| | ආහාර, පාන වර්ග හා දුම්කොළ | 50.4 | 41.9 | -16.9 | 92.1 | 76.6 | -16.8 |
| | යන්ත්‍රසූත්‍ර හා යාන්ත්‍රික උපකරණ | 44.8 | 52.4 | 16.8 | 89.5 | 103.1 | 15.2 |
| | මැණික්, දියමන්ති හා ස්වර්ණාභරණ | 26.9 | 32.5 | 20.7 | 58.8 | 86.6 | 47.2 |
| | සම්භාණ්ඩ, සංචාරක භාණ්ඩ හා පාවහන් | 5.9 | 5.9 | 0.5 | 10.1 | 11.1 | 10.0 |
| **ඛනිජ හා වෙනත් අපනයන** | | **5.8** | **3.7** | **-36.3** | **11.9** | **9.6** | **-19.2** |
| **මුළු අපනයන** | | **1,093.3** | **982.0** | **-10.2** | **2,195.9** | **1,960.1** | **-10.7** |

## ආනයන ක්‍රියාකාරිත්වය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | | පෙබ. 2022 | පෙබ. 2023 | වෙනස (%) | ජන. - පෙබ. 2022 | ජන. - පෙබ. 2023 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **පාරිභෝගික භාණ්ඩ** | | **298.8** | **202.2** | **-32.3** | **658.8** | **420.7** | **-36.1** |
| **ආහාර හා පාන වර්ග** | | 161.4 | 114.8 | -28.9 | 348.6 | 233.1 | -33.1 |
| එයින් | එළවළු (ආ) | 33.0 | 20.0 | -39.3 | 62.6 | 44.1 | -29.5 |
| | සහල් | 32.9 | 1.6 | -95.0 | 89.5 | 3.8 | -95.8 |
| **වෙනත් ආහාරමය නොවන පාරිභෝගික භාණ්ඩ** | | 137.3 | 87.5 | -36.3 | 310.2 | 187.6 | -39.5 |
| එයින් | බෙහෙත් හා ඖෂධීය නිෂ්පාදිත | 44.5 | 42.0 | -5.7 | 123.4 | 93.0 | -24.7 |
| **අන්තර් භාණ්ඩ** | | **1,219.8** | **637.7** | **-47.7** | **2,432.3** | **1,608.2** | **-33.9** |
| එයින් | ඉන්ධන | 462.2 | 204.3 | -55.8 | 892.5 | 685.4 | -23.2 |
| | රෙදිපිළි හා රෙදිපිළි උපාංග | 323.1 | 166.0 | -48.6 | 639.7 | 383.4 | -40.1 |
| | පොහොර | 4.2 | 5.8 | 39.2 | 6.7 | 15.4 | 131.2 |
| | තිරිඟු හා ඉරිඟු | 15.8 | 34.0 | 114.9 | 57.5 | 39.6 | -31.2 |
| **ආයෝජන භාණ්ඩ හා වෙනත්** | | **354.4** | **181.1** | **-48.9** | **741.2** | **380.1** | **-48.7** |
| එයින් | යන්ත්‍රසූත්‍ර හා උපකරණ | 224.3 | 127.2 | -43.3 | 468.1 | 259.8 | -44.5 |
| **මුළු ආනයන** | | **1,872.9** | **1,021.0** | **-45.5** | **3,832.3** | **2,409.0** | **-37.1** |

## වෙළඳ ශේෂය (එ.ජ. ඩොලර් මිලියන)

| කාණ්ඩය | පෙබ. 2022 | පෙබ. 2023 | වෙනස (%) | ජන. - පෙබ. 2022 | ජන. - පෙබ. 2023 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|
| **වෙළඳ ශේෂය** | -779.6 | -39.1 | | -1,636.4 | -448.9 | |

## වෙළඳ දර්ශක හා වෙළඳ මිල අනුපාතය (2010 = 100) (ඇ)

| කාණ්ඩය | | පෙබ. 2022 | පෙබ. 2023 | වෙනස (%) | ජන. - පෙබ. 2022 | ජන. - පෙබ. 2023 | වෙනස (%) |
|---|---|---|---|---|---|---|---|
| **අපනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 152.2 | 136.7 | -10.2 | 152.8 | 136.4 | -10.7 |
| | පරිමා දර්ශකය | 144.7 | 140.5 | -2.9 | 156.1 | 166.3 | 6.5 |
| | මිල දර්ශකය | 105.1 | 97.2 | -7.5 | 97.9 | 82.0 | -16.2 |
| **ආනයන** | | | | | | | |
| | වටිනාකම් දර්ශකය | 167.6 | 91.4 | -45.5 | 171.5 | 107.8 | -37.1 |
| | පරිමා දර්ශකය | 161.1 | 101.8 | -36.8 | 165.4 | 129.6 | -21.7 |
| | මිල දර්ශකය | 104.0 | 89.8 | -13.7 | 103.7 | 83.2 | -19.8 |
| **වෙළඳ මිල අනුපාතය** | | 101.1 | 108.3 | 7.2 | 94.4 | 98.6 | 4.4 |

(අ) තාවකාලික

(ආ) පරිප්පු, ළූණු, අර්තාපල්, රනිල කුලයට අයත් එළවළු සහ වෙනත් එළවළු ඇතුළත් වේ.

(ඇ) එ.ජ. ඩොලර්වලින් ගණනය කරන ලද

ජාත්‍යන්තර වෙළඳාම සහ වෙළඳ භාණ්ඩ අධ්‍යයන අංශය /ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව